
2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

539/42

කරගම්පිටිය



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 539/42-කරගම්පිටිය

## ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

චන්දන ද සිල්වා මහතා

# පටුන


1. පිහිටීම, 01

2. සාමාජයීය හා සංස්කෘතික කරුණු හා මූලික තොරතුරු 01

3. වසමේ සිතියම 02

4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම:- 03-04

5. නිපුණතා සංවර්ධන සැලැස්ම 05-07

6. සමාජ සංවර්ධන සැලැස්ම:- 08-10

7. සෞඛ්‍ය හා පෝෂණ සැලැස්ම:- 11

8. විදුලිය සහ ජල පහසුකම් සංවර්ධනය කිරීම. 11-12

9. ක්‍රීඩා හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් 13

10. අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය:- 14

11. ඉතා දිළිදු අය සඳහා වන සංවර්ධන සැලැස්ම:- 15

12. කාන්තා සවිබල ගැන්වීම:- 15

13. පරිසර කලමණාකරන සැලැස්ම:- 16-18

14. කෘෂිකර්ම සැලැස්ම:- 18-19

## 01.පිහිටීම

දෙහිවල ප්‍රදේශයේ ඉතිහාසය පිළිබඳ විවිධ අදහස් ජනප්‍රවාදයේ සඳහන් වේ. දෙහිවල නාමය සෑදී ඇති ආකාරය පිළිබඳ විවිධ අදහස් ජනප්‍රවාදයේ සඳහන්ව පවතී. මේ අතරින් පොකුණු හා ජල වලවල් ඇති ප්‍රදේශයක් (දිය+වල) පසුව දෙහිවල වු බවට මතයක් ඇත. දෙහි වගාවට ඉතා ප්‍රසිද්ධියක් ඉසිලූ බවත්. දෙහි+වන (දෙහි+කැලෑව) පසුව දෙහිවල වු බවට තවත් ජනප්‍රවාදයක් පවතී. මෙම දෙහිවල කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 15 කින් සමන්විත වේ. මෙම ගම් 15 අතරින් ප්‍රමාණයෙන් කුඩාම වසමක් ලෙස කරගම්පිටිය හැඳින්විය හැක. එය හෙක්ටයාර 325 වේ. (වර්ග කිලෝ මීටර් 0.325 වේ) මෙම කරගම්පිටිය වසමට උතුරින් මල්වත්ත ග්‍රාමයත්, දකුණින් බටහිර කව්ඩාන ග්‍රාමයත්, නැගෙනහිරින් නැගෙනහිර කව්ඩාන ග්‍රාමයත්, බටහිරින් ජයතිලක ග්‍රාමයත් පිහිටා ඇත.

## 02.සාමාජයීය හා සංස්කෘතික කරුණු හා මූලික තොරතුරු

කරගම්පිටිය යන නම ඇතිවූ අකාරය පිළිබඳව කරාව කුලයට අයත් (මසුන් අල්ලන්නන්) විශාල ප්‍රමාණයක් සිටි ග්‍රාමය පසුව කර+ගම්පිටිය ලෙස ව්‍යවහාර වු බව ජනප්‍රවාදයේ සඳහන් වේ. කරගම්පිටිය වසම තුල ප්‍රධාන වශයෙන් සිංහල, මුස්ලිම්, දෙමල, බර්ගර් සහ මැලේ යන ජන කොටස් ජීවත් වේ. ආගම් වශයෙන් ගත්කල බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික (ක්‍රිස්තියානි) ප්‍රධාන වශයෙන් එකට ජීවත් වේ. 80% පමණ ජනතාව ස්ථිර පදිංචිකරුවන් වන අතර 20% පමණ ප්‍රතිශතයක් කුලී නිවැසියන් වේ. ජනතාව තුල අධ්‍යාපන මට්ටමේ, සමාජ හා ආර්ථික මට්ටමේ පැහැදිලි විෂමතාවන් දක්නට ලැබේ.

අචාර්යවරු, වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, මාසික වැටුප් උපයා ජීවත් වන අය මෙන් දෛනික වැටුප් ලබා එදා වේල හරි හම්බ කර ගන්නා අයද මේ වසම තුල ජීවත් වේ. අඩු ආදායම් ලබන අය සමස්ථයක් ලෙස ගත් කල අඩු ප්‍රතිශතයක් ගනී. වැඩි පිරිස ඉහල හා මධ්‍යම පන්තියට අයත් වුවන් වේ.

කරගම්පිටිය වසම පොලීසියක්, පාසැලක්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක්, ආයුර්වේද බෙහෙත් ශාලාවක්, උප තැපැල් කාර්යාලයක්, ළමා හා මාතෘ සායනයක්, කාය වර්ධන මධ්‍යස්ථානයක්,ළමා උද්‍යානයක්, ක්‍රීඩා පිටියක්, මුස්ලිම් අධ්‍යාපන ආයතනයක්, පෞද්ගලික බැංකුවකින්, පොදු නාන ළිඳකින් සහ සුපිරි වෙළඳසැලකින්ද සමන්විත වේ.

මෙම වසම තුල සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කිහිපයක්ද ස්ථානගතව ඇත. මේ වසමට අයත් ප්‍රධාන මාර්ග අතර ගාලුපාර, කව්ඩාන පාර, හිල් වීදිය ප්‍රධාන වේ. මීට අමතරව පල්ලිදොර පාර, සිරිවර්ධන පාර, යුනියන් පෙදෙස, විශාල මාර්ග වේ. මීට අමතරව කුඩා අතුරු පාරවල් ප්‍රනාන්දු පාර,කරගම්පිටිය හරස් පාර, සුදර්මා මාවත, ධර්මාරාම මාවත, සුබෝධාරාම පාර, අපෝන්සු මාවත, ගාමිණී පෙදෙස, ශාන්තාරාම පාර, යෝගා පෙදෙස වේ. මෙම මාර්ග පළලින් අඩි 12 ත් 15 අතර වේ.

## 03.වසමේ සිතියම




## 04.ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම:-

අලුත් කොළඹ - වෙළඳ හා මූල්‍ය පුරවරය ලෙස වරාය නගරය හා ප්‍රධාන මාර්ග සංවර්ධනය කරන විට මූල්‍ය කටයුතු වල වැඩිවීමත් සමඟම ඊට සමගාමීව මාර්ග පද්ධතියද නවීකරණය වීම අතිශයින් වැදගත් කරුණකි. මූල්‍ය කේන්ද්‍රයට ප්‍රවිශ්ය වීමට සහ ඉන් පිටවීමට ඇති ප්‍රධාන දොරටුවක් වන ගාලු පාර නවීකරණය විය යුතුය.

නවීණ ජාත්‍යාන්තර තාක්ෂණයට අනුව සැකසුණු පුළුල් මංමාවත් ප්‍රධාන මාර්ගයන්හි ඉදිකිරීම රටේ සංවර්ධනයට අත්‍යාවශ්‍ය සාධකයකි. භාණ්ඩ ප්‍රවාහනයට මෙන්ම පුද්ගල ප්‍රවාහන පහසුකම් සඳහාද දුම්රිය, බස්රථ, පුද්ගලික ප්‍රවාහනයද දියුණු වීමට, දුම්රිය මාර්ගයේ වැඩිදියුණුවත් ,මාර්ගවල වාහන තදබදය අවම වන ආකාරයට මාර්ග වැඩිදියුණු කිරීමද ප්‍රධාන වශයෙන් කල යුතුව ඇත.

ඊට සමගාමීව කරගම්පිටිය වසමේ අතුරු මාර්ගද වැඩිදියුණු කල යුතුව ඇත. දැනට පවතින අඩුපාඩු අතර පටු මංමාවත් තිබීම හේතුවෙන් වාහනවලට මාරුවීමට ඇති ඉඩකඩ සීමිත බැවින් ප්‍රමාදය මගහරවා ගැනීමට, වාහනවලට පහසුවෙන් හා ඉක්මනින් මාරුවීමට මාර්ගය දෙපස ඇති කාණුවලට උඩින් ස්ලැබ් පියන් දමා එම ඉඩද වාහන ගමනාගමනයට යොදා ගත හැකි අයුරින් සකසා ගැනීමද වැදගත් වේ. මීට අමතරව පටු මංමාවත්වල වාහන නවතා තැබීම තහනම් කරන පුවරු ස්ථාපනය කොට එම කටයුතු ඒ අකාරයට සිදුවේද යන්න නියාමනය කල යුතු වෙයි. එවිට කාර්යක්ෂමව ජනතාවට එදිනෙදා කාර්යයන් සිදුකර ගැනීමට හැකිය.

කරගම්පිටිය පල්ලිදොර පාරේ ආරම්භයේම පිහිටා ඇති ජාතික පුහුණු අධිකාරියට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සතු යටිතල පහසුකම් සංවර්ධනය මගින් වැඩි පිරිසකට වෘත්තීය අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව උදා කර දිය හැකිය.

මෙම ආයතනයේ පුස්තකාල, දේශන ශාලා, සනීපාරක්ෂක පහසුකම්, පරිඝණක පහසුකම්, සන්නිවේදන පහසුකම්, අන්තර්ජාල පහසුකම්, smart boards වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කිරීම මගින් පාසැල් හැරයන පිරිස වෘත්තීය අධ්‍යාපනයට යොමු කොට ඵලදායි පුරවැසියන් බවට පත් කිරීමට හැකිවේ.

ප්‍රදේශයේ ඇති කාණු පද්ධතිය නවීකරණය කොට වරින් වර කාණු ශුද්ධ පවිත්‍ර කොට නඩත්තු කිරීම මගින් කාණුවලින් නිකුත්වන දුර්ගන්ධය හා ඩෙංගු මදුරුවන් බෝවීම වලක්වා ගත හැකිය.

සංවර්ධනය නොකොට ඉතිරිවූ අතුරු මාර්ග සංවර්ධනය තුලින් පහසුවෙන් ගමන් කිරීමේ අවස්ථාව ප්‍රදේශවාසී සැමට උදාකරදිය හැක.

ශාන්තාරාමයේ පිහිටි කායවර්ධන මධ්‍යස්ථානයේ උඩු මහල රැස්වීම් ශාලාවක් ලෙස සංවර්ධනය කිරීම මගින් සමිති සමාගම්වලට එම ස්ථානය රැස්වීම් පවත්වන ස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගත හැක.

දැනට ග්‍රාම නිලධාරි කාර්යාලයේ ඇති ප්ලාස්ටික් පුටු සංඛ්‍යාව කිසිසේත් ප්‍රමානවත් නොවේ. අලුතින් ඇදි සහිත පුටු 20 ලබාදීම මගින් එහි සේවාලබාගැනීමට එන ජනතාවට සෙත සැලසේ.

ශාන්තාරාමයේ ආයුර්වේද බෙහෙත් ශාලාව සහ පල්ලිදොර පාරේ පිහිටි උප තැපැල් කාර්යාලයේ නඩත්තු කටයුතු සිදුකල යුතුය.

වීදි පහන් නොමැති ස්ථානවල වීදි පහන් සවිකර එවායේ නඩත්තු කටයුතු සිදුකල යුතුය.

වසමේ පවුල් කිහිපයක් සතු සනීපාරක්ෂක පහසුකම් ඉතාමත් පහත් තත්වයක පවතී. ඇතැමුන් පොදු වැසිකිළි පරිහරණය කරයි. අනෙක් අයට වැසිකිළි තිබුනද එවා අබලන් මට්ටමක පවතී. මේ කොට්ඨාශ දෙකටම පොදු වැසිකිළි ඉදිකරදීම කල යුතුය.

කරගම්පිටිය ග්‍රාමයට සුදුසු මලඅපවහන පද්ධතියක් ස්ථාපනය කල යුතුය. එසේ කරන තෙක් අතුරු මාර්ගවල ඇති කාණුවලට පදිංචිකරුවන් මලඅපවහන ජලය බැහැර කිරීම නැවැත්වීමට කටයුතු කල යුතුය. අතුරු මාර්ගවල ඇති කාණුවලට මලඅපවහන ජලය බැහැර කිරීම හේතුවෙන් විශේෂයෙන් ශාන්තාරාම ප්‍රදේශය දූර්ලන්ධව ඉතා අපිරිසිදුව පවතින බව නිරීක්ෂණය කල හැකිය. මෙයට පිළියමක් ලෙස කාණුවලට septic tank සම්බන්ධ කිරීම තහනම් කර එම මලඅපවහන ජලය නිසියාකාරව බැහැර කිරීම අනිවාර්යය කිරීමට දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව සහ අදාළ රාජ්‍ය ආයතන කටයුතු කල යුතුය. නගර සභාව මගින් එම මලඅපවහන ජලය ගලි බව්සර් යොදා septic tank හිස් කිරීමට පදිංචිකරුවන්ට සහනදායී මිලකට සිදු කළ යුතු වෙයි.

විදුලිය සැපයිමේදී නියමිත වොල්ටීයතාව රදවා ගැනීම කල යුතුය. ජල පීඩනය රදවා ගැනීමද කල යුතුය.

ටෙලිකොම් සමාගම මගින් අනාගත දත්ත සම්ප්‍රේෂණ වේගයන්ට ලගාවීම සඳහා Fiber optic රැහැන්වලින් සමන්විත තාක්ෂණයෙන් යුත් සම්ප්‍රේෂණ මාර්ග පද්ධතියක් කරගම්පිටිය වසම තුළ ස්ථාපිත කළ යුතු වෙයි.

| | |
|---|---|
| ගැටලුව | මාර්ග අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැයවන කාලය හා ප්‍රමාදය, වර්ෂා කාලයේ මාර්ග ජලයෙන් යටවීම, සුළු ගංවතුර ඇතිවී නිවාස වලට හානි වීම. |
| **අරමුණු** | උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම, වර්ෂා කාලයේදී ජලය විධිමත්ව බැස යන ලෙස කාණු පද්ධති සැකසීම. |
| උපායමාර්ග | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරී දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණ නිලධාරී පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරී මගින් අබලන් මාර්ග පරීක්ෂා කර ගැලපෙන ක්‍රමවේදයන් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි මාර්ග කාණු සංවර්ධනය කිරීම. |
| **ක්‍රියාකාරකම** | මාර්ග හා කාණු පද්ධති<br><br>1.දෙහිවල කව්ඩාන පාරේ අංක 119 හැරෙන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. දිග අඩි 70 පළල අඩි 10<br><br>2.කව්ඩාන පාරේ අංක 51 පාරෙන් හැරෙන අතුරු මාර්ගයේ කොන්ක්‍රීට් කාණුව ඉදිකර ස්ලැබ් දැමීම.<br><br>3.දැහැමි පටුමග දකුණුපස ඇති අතුරු මාර්ගය සම්පූර්ණයෙන් කොන්ක්රීට් කිරීම. දිග අඩි 150 පළල අඩි 8<br><br>4.දැහැමි පටුමග ප්‍රධාන කාණුව ස්ලැබ් පියන් යොදා ආවරණය කිරීම. දිග අඩි 100 පළල අඩි 4 අගල් 6<br><br>5.දෙහිවල කව්ඩාන පාරේ අංක 07 හැරෙන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.දිග අඩි 100 පළල අඩි 11 |
| කාලය | අවුරුදු 1යි |
| **සජු ප්‍රතිලාභීන්** | ව්‍යාපෘතිය කරන මාර්ගයේ දෙපස පදිංචිකරුවන්. |
| **වක්‍ර ප්‍රතිලාභීන්** | අදාල මාර්ගය භාවිතයට ගන්නා සියලු දෙනා. |
| වගකීම | ආර්ථික සංවර්ධන නිලධාරී,දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, තාක්ෂණ නිලධාරි |

## 05.නිපුණතා සංවර්ධන සැලැස්ම

පල්ලිදොර පාරේ VTC ආයතනයේ පාඨමලා අනාගත රැකියා වෙළඳපොල ඉලක්ක කර ගෙන සංශෝධනය කල යුතුය. නව්‍යකරණ දැනුම සහිත සම්පත්දායකයින් (දේශකයින් හා උපදේශකවරුන්) අළුතින් බඳවා ගත යුතුය. අ.පො.ස සා/පෙළ හා අ.පො.ස උ/පෙළ පෙනිසිට අධ්‍යාපනය අවසන් කරන තරුණ තරුණියන් ඉලක්ක කර වෘත්තීය දැනුම හා කුසලතා වර්ධනයට යොමුවීමට තරුණ තරුණියන් පෙළඹවීමට පුළුල් ප්‍රචාරයක් දියත් කල යුතුය. නිපුණතා වර්ධනයට සමගාමීව ආකල්ප වෙනස් කිරීමේද පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කල යුතුය.

දැනට සිටින රැකියා විරහිත, ඌණ සේවා නියුක්ත තරුණ පිරිස හඳුනා ගෙන, ඔවුන් සතු කුසලතා හඳුනා ගෙන ඒවාට ගැලපෙන ලෙස සංචාරක ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය, කෘෂිකර්ම ක්ෂේත්‍රය, රූපලාවන්‍ය ක්ෂේත්‍රය, කර්මාන්ත ක්ෂේත්‍රය, වැනි ක්ෂේත්‍ර වල ඉහලට යා හැකි අයුරින් න්‍යායාත්මක දැනුම ලබාදීම හා කුසලතා සංවර්ධනය මගින් ඔවුන් රටේ ශ්‍රම බලකායේ සක්‍රිය සමාජිකයින් ලෙස පෙරට එමට හැකි වනු ඇත.

වසමේ ඇති සුමග විදුහල වැසීයාමේ තර්ජනයට කලක සිට මුහුණදී සිටින පාසැලකි. ශිෂ්‍යයින් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් අඩුවී ඇත. බොහෝ දෙමාපියන් තම දරුවන් ජනප්‍රිය පාසැල්වලට ඇතුලත් කර ගැනීම සඳහා වැඩි කැමැත්තක් දක්වයි. මේ නිසා දරුවන් ගමේ ආසන්නතම පාසැලට නොයවා දුර බැහැර ඇති සම්පත් බහුල ජනප්‍රිය පාසැල් සොයා යාම නිසා මෙම සුමඟ පාසැල කලක සිට පසුගාමී තත්වයකට පත්ව ඇත. ඉගැන්වීම සඳහා ගුරුවරුන් සිටින්නේද තුන් හතර දෙනෙකි. පාසැලේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සංඛ්‍යාව 25 කට අඩුය. මේ හේතු නිසා මෙම සුමඟ පාසැල කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය මගින් විශේෂ අවශ්‍යතා සහිත (විශේෂ හැකියාවන් සහිත) දරුවන් සඳහා වූ පාසැලක් ලෙස දියුණු කිරීමට සැලසුම් සකස් කොට තිබුණද එවැන්නක්ද සිදුවුයේ නැත. මේ පිළිබඳ සුදුසු ශක්‍යතා අධ්‍යනයක් සිදුකොට සුමඟ විදුහල සතු ගොඩනැගිලි, භූමිය සහ වෙනත් පහසුකම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගන්නේ කෙසේද යන්න සොයා බලා සුදුසු පියවරක් ගත යුතුය. මෙම සුමඟ විදුහල සතු සම්පත් කලාප අධ්‍යාපන කාර්යාලය මැදිහත්වී සෙසු දරුවන්ට ප්‍රයෝජනවත් වන ලෙස සකස් කිරීම කළ යුතු වෙයි.

රටේ අනාගතය රඳා පවතින්නේ තරුණයන් මතය. එබැවින් තරුණ පිරිස ව්‍යවසායකයින් බවට පත්කිරීමෙන් රටේ දල ජාතික නිෂ්පාදිතය සීඝ්‍රව ඉහල දැමිය හැක. අවුරුදු 40 ට අඩු තරුණ පිරිසට තමන්ගේම ව්‍යාපාර පටන් ගැනීමට, ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමේ සිට තාක්ෂණික දැනුම, අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සහන මිලට ලබා දීම, බදු සහන, ණය පහසුකම් සලසා දීම, වෙළඳපොල අවස්ථා සලසා දීම (සල්පිල් පැවැත්වීම) වැනි දේවලින් දිරිගැන්වීම් ලබාදීම කල හැක.

දැනට රැකියාවල නියුක්තවුවන්ගේ ඵලදායිත්වය වැඩි කිරීම සඳහා තාක්ෂණ හා තොරතුරු සන්නිවේදනය පිළිබඳ දැනුම අවබෝධය වැඩි කිරීම මගින් හා ඔවුන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ මෙවලම් ලබාදීම තුලින් ස්මාර්ට් ජංගම දුරකථන, ටැබ් හා ලැප්ටොප් ලබාදීම කල හැක.

21 වන සියවස තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනයේ ශතවර්ෂය ලෙස හැදින්වේ. තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනය දියුණු කිරීම මගින් පුද්ගලයින්ගේ විශේෂයෙන් තරුණයින්ගේ නිපුණතා හා හැකියා වර්ධනය තාක්ෂණික ඥානය මත පදනම්ව ඉහල දැමීමට කටයුතු කල හැක.

පාසැල් දරුවන්ට විභාග කේන්ද්‍ර අධ්‍යාපනය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍ර අධ්‍යාපනයක් ලබාදීම වඩාත් ප්‍රයෝගිකය. තමන් සතු සහජ දක්ෂතාවන් කලින්ම හඳුනාගෙන ඒවා වැඩිදියුණු කර ගැනීමට පියවර ගැනීම මගින් තෘප්තිමත් තරුණ පරපුරක් බිහි කිරීමට ඉඩ සැලසේ.

ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීමට නව ප්‍රවණතා පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුයි. සම්ප්‍රදායික කර්මාණ්ත වෙනුවට කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, කුඩා හා මධ්‍යම ව්‍යාපාර සංවර්ධන ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය වැනි ආයතන සමඟ එක්ව රූපලාවන්‍ය නිෂ්පාදන, තාක්ෂණික නිෂ්පාදන, කාබනික පොහොර මගින් වගාකල කෘෂි නිෂ්පාදන, ආයුර්වේද නිෂ්පාදන, අමුද්‍රව්‍ය වෙනුවට එකතුකල අගය වැඩි ඇසුරුම් කරන ලද නිමි භාණ්ඩ, විවිධ අකාරයට සකස් කරන ලද අගය එකතු කල නිෂ්පාදන, සකස්කල කෘෂි නිෂ්පාදන වැනි භාණ්ඩ සඳහා නූතනයේ පවතින වෙළඳ අවස්ථා ප්‍රයෝජනයට ගත හැක.

පුද්ගලික හා රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන රැකියා වෙළඳපොලක් ප්‍රදේශයේ රැකියා අපේක්ෂිත තරුණ තරුණියන්, කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන තරුණයින් සම්බන්ධ කරගෙන පැවැත්වීම මගින් ඉතා ඉක්මනින් රැකියාලාභීන් බිහි කිරීමට ඉඩ සැලසේ. ඒ අවස්ථාවේදීම ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ඔවුන්ගේ ජීව දත්ත පත්‍රිකා ලබාගෙන ඔවුන්ව සුදුසු රැකියාවලට අනුයුක්ත කර ගැනීම කල හැකිය. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන නිපුණතා සංවර්ධන නිලධාරි, මානව සම්පත් සංවර්ධන සහකාර, කුඩා ව්‍යාපාර ව්‍යවසායකත්ව සංවර්ධන නිලධාරි මගින් රැකියා මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය.

| | | |
|---|---|---|
| **01** | ගැටළුව | පාසැල් අඩු අධ්‍යාපනය ලබා පාසැල් හැරයන තරුණ තරුණියන් තුල වෘත්තීය කුසලතා අවම මට්ටමක තිබිම. |
| | අරමුණ | තරුණ තරුණියන් වෘත්තීය නිපුණතා මට්ටම ඉහල දැමීම. |
| | උපායමාර්ග | වෘත්තීය පුහුණුවක් නොමැති තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුවක් ලබාදීම. |
| | ක්‍රියාකාරකම්:- | VTC (වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට යොමු කල යුතු අය හඳුනා ගැනීම. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ගැලපෙන පාඨමාලා සඳහා යොමු කිරීම.) |
| | කාලය | මාස 3 සිට අවුරුදු 1 දක්වා |
| | **සෘජු ප්‍රතිලාභීන්** | පාඨමාලා හදාරන තරුණ තරුණියන් |
| | වක්‍ර ප්‍රතිලාභීන් | පාඨමාලා හදාරන තරුණ තරුණියන්ගේ පවුලේ සමාජිකයින් |
| | වගකීම | නිපුණතා සංවර්ධන නිලධාරී, විද්‍යා තාක්ෂණ නිලධාරී |
| **02.** | ගැටළුව | න්‍යාය හා ප්‍රායෝගික පුහුණුව අවම මට්ටමක තිබිම. |
| | අරමුණු | සම්ප්‍රදායික රැකියාවල යෙදී සිටින අයගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම. |
| | උපායමාර්ග | වෘත්තීමය නව තාක්ෂණ දැනුම වර්තමානයට ගැලපෙන ලෙස ලබාදීම. |
| | ක්‍රියාකාරකම් | පාසැල් අධ්‍යාපනය අතරමග නතර කරන ලද සිසුන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට යොමු කිරීම.<br>උසස් අධ්‍යාපනය ලබා ගැනීමට කැමැත්තක් දක්වන සිසුන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කරවීම.<br>අදාල විෂය අංශ තොරා ගැනීමට මාර්ගෝපදේශකත්වය ලබා දීම. |
| | කාලය:- | මාස 3 සිට අවුරුදු 1 දක්වා |
| | සජු ප්‍රතිලාභීන් | පාඨමාලා හදාරන තරුණ තරුණියන් |
| | වක්‍ර ප්‍රතිලාභීන් | පාඨමාලා හදාරන තරුණ තරුණියන්ගේ පවුලේ සමාජිකයින් |
| | වගකීම | ආර්ථික සංවර්ධන නිලධාරී, නිපුණතා සංවර්ධන නිලධාරී, විද්‍යා තාක්ෂණ නිලධාරී |

## 06.සමාජ සංවර්ධන සැලැස්ම:-

සැමට සුවපහසු නිවෙසක් යන්න රජයේ අරමුණයි. මෙම ප්‍රදේශයේ බහුතරයකට මෙකී තත්වය තිබුණත් පවුල් 40 කට තවමත් උදාකරගැනීමට නොහැකිවී ඇත. විශේෂයෙන්ම කරගම්පිටිය ග්‍රාමයේ දැහැමි පටුමග, සිරිවර්ධන පාර, ශාන්තාරාමය තුල අඩු පහසුකම් සහිත නිවාස දක්නට ඇත. මීට ඉහත රජය විසින් ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන වැඩසටහන් යටතේ යම්තාක් දුරකට ඔවුන්ගේ නිවාසවල අළුත්වැඩියා කටයුතු සිදු කලද මෙම නිවාසවල ඇති ඉඩකඩ අඩුවීම ප්‍රධාන ගැටළුවකි. මීන් බොහෝමයක් නිවෙස්වල පවුලේ වැඩි සමාජික පිරිසක් එකට ජීවත් වීම හා පවුල් කිහිපයක් එක නිවෙසක් තුල ජීවත් වීම සමාජීය ගැටළුවක් බවට පත් කරයි. ඔවුන් සතු සනීපාරක්ෂක පහසුකම්ද ඇතැම් නිවෙස්වල ඉතා අඩු මට්ටමක පවතී. මෙයට පිළියමක් ලෙස තට්ටු නිවාස යෝජනා ක්‍රමයක් කරගම්පිටිය ග්‍රාමය ආශ්‍රිතව ගොඩනැගීම සුදුසු පියවරක් ලෙස හැදින්විය හැක. මෙය වඩාත් උචිත වන්නේ භූමිය ඉතා මිල අධිකවීම නිසාවෙනි. රජයෙන් සුදුසු ඉඩමක් මිලට ගෙන මහල් නිවාස ගොඩනගා සහන මිලකට එවා ප්‍රතිලාභීන්ට ලබා දිය හැකිය. ප්‍රතිලාභීන් බංකු ණයක් මගින් මහල් නිවාස ඇපයට තබා එම ණය මගින් එකවර රජයට මුදල් ගෙවා කොටස් වශයෙන් මාස්පතා බැංකු ණය ගෙවා නිවස ඇපයෙන් නිදහස් කර ගැනිමට පුළුවන. මෙමගින් අඩු අදායම් ලාභී ප්‍රජාවට ප්‍රමිතියෙන් යුතු නිවෙසක් හිමිවීම මෙන්ම සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණුවීමද සිදුවේ.

නූතන ලෝකය මුහුණ දී සිටින භායානකම ගැටළුවක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතය හැදින්විය හැක. මධ්‍යසාර හා දුම්වැටි භාවිතය කලක සිට ප්‍රචලිත වවුද හෙරොයින්, කොකෙන්, අයිස් වැනි භායානක මත්ද්‍රව්‍යවලට තරුණ පිරිස යොමු වී සිටීම ප්‍රධානතම සමාජ ගැටළුවකි. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ප්‍රධානතම ඉලක්කය දරුවන්ය. තම මත්ද්‍රව්‍ය ජාවාරමට දීර්ඝ කාලයක් ප්‍රතිලාභ හිමිවන්නේ වයසින් අඩු දරුවන්ගෙන් වන බැවිනි. මත්ද්‍රව්‍ය සිගරට්, දුම්කොල ආශ්‍රිත නිෂ්පාදන, මධ්‍යසාර, මත් පෙති, මත් කුඩු වැනි විවිධ ස්වරූපයන් ගන්නා අතර ඇතැම් මත්ද්‍රව්‍යවලින් ඉතා කෙටි කාලයක් තුල භායානක ප්‍රතිපල අත්වීමට පුළුවන. මෙම මත්ද්‍රව්‍ය උවදුරෙන් තරුණ පිරිසත් පොදුවේ ප්‍රජාවත් මුදවා ගැනීමට මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු වසම් මට්ටමින් ස්ථාපිත කොට ඇත. මෙමගින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් එයට ඇබ්බැහිවූවන් සම්බන්ධ තොරතුරු ලබාදීම මගින් මත්උවදුරෙන් රට නිදහස් කිරීමට ඉඩ සැලසේ. මීට අමතරව සිවිල් ආරක්ෂක කමිටු (සුරකිමු ලංකා) මගින්ද තොරතුරු ආරක්ෂක අංශ වෙත ලබාදීම සිදු කරයි.

පාසැල් නොයන ලමුන් මෙතෙක් වාර්තා වී නොමැත. සැම දරුවෙකුටම තම කුසලතා හා හැකියාවන් වර්ධනයට සමාන අවස්ථා සලසා දිය යුතුයි. දියුණු නගරයේ ජනප්‍රිය පාසැල්වලට යන ලමුන්ට හිමිව තිබෙන පහසුකම් හැකිතාක් දුරට ගමේ ඉස්කෝලේ ලමුන්ටත් ලබාදීම, සම්පත් සමානව බෙදී යන ලෙස කටයුතු කිරීම වැදගත්ය.

අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීමට එළවළු පලතුරු ගෙවත්තේම වගාකර එවා පරිභෝජනයට ගැනීමට සැලැස්වීමට යොමු විය යුතුයි. අඩු පහසුකම් සහිත නිවාස බොහෝමයකට මීට ඉහතදී සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති වලදී නිවෙස් සඳහා ස්ථිර වහලක් ලෙස නිවෙස් සඳහා කොන්ක්‍රීට් ස්ලැබ් දමා දී ඇති අතර ඔවුනට පොච්චිවල එලවළු, මිරිස්, පලාවර්ග වැවීම මගින් වස විසෙන් තොර ආහාර වෙලක් නිවසින්ම නොමිලේ සපයා ගැනීමට හැකිය. මීට අමතරව ඉතා අඩු ඉඩ ප්‍රමාණයක වගා කටයුතු කල හැකි සිරස් වගාවන් සඳහාද අඩු අදායම්ලාභි පවුල් යොමු කල හැකිය. මෙම සිරස් වගාව සඳහා යොමු විය යුත්තේ අඩු පහසුකම් සහිත අයවලුන් සතු ඉඩම් ප්‍රමාණයද සීමා සහිත වන බැවිනි. අඩු පහසුකම් සහිත ප්‍රජාවට ඉතා වැදගත් වන හොද සෞඛ්‍ය පුරුදු ඇතිකිරීම කල යුතුය. සමබර අහාරවේලක්, පිරිසිදු පානීය ජලය පානය කිරීම මගින් ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම

ඉහල දමා රෝගී වීමට ඇති අවස්ථා අඩු කරගත හැකිය. කාන්තාවන් සවිබල ගැන්වීම මගින් පවුල් සංස්ථාවටම බලපාන ගැටළු බොහෝමයක් නිරාකරණය කරගත හැකිය.

සෞඛ්‍ය සේවා සැපයීමේදී සිටින ජනගහනයට ප්‍රමාණවත් පරිදි සෞඛ්‍ය පහසුකම් වර්ධනය නොවීම හේතුවෙන් සෞඛ්‍ය සේවා සැපයීමේදී ප්‍රමාදයක් හා ගුණාත්මක බවින් අඩු බවක් දක්නට ලැබේ. ප්‍රධාන සැත්කම් සහ අනෙකුත් ස්කෑන් පරීක්ෂණ සඳහා දීර්ඝ පොරොත්තු ලේඛනයක් පවතී. අඩු බර සහිත දරු උපත්, වයස අනුව අඩු බර දරුවන්, මන්ද පෝෂණයෙන් පෙලෙන දරුවන් ප්‍රමාණයෙන් අඩු වුවද සැලකිය යුතු කොටසක් වසම තුල ජීවත් වේ.

| | | |
|---|---|---|
| **01** | ගැටළුව | වැඩිහිටියන් සමාජයේ හුදකලා වීමෙන් පිඩාවට පත්වීම |
| | අරමුණු | වැඩිහිටි ප්‍රජාව සමාජයේ සක්‍රීය පිරිසක් බවට පත් කිරීම. |
| | උපායමාර්ග | වැඩිහිටි පිරිස සවිබලකරණය යටතේ සමාජයේ සක්‍රීය ලෙස දායක විය හැකි අයුරින් වැඩසටහන් සංවිධානය කිරීම. |
| | ක්‍රියාකාරකම් | වැඩිහිටි සුහද හමු පැවැත්වීම, වැඩිහිටි සමිති සක්‍රීය කර යාවත්කාලීන කිරීම. |
| | කාලය | අවුරුදු 1 |
| | ප්‍රතිලාභීන් | වැඩිහිටි ප්‍රජාව |
| | වගකීම | සමාජ සේවා නිලධාරී |
| **02.** | ගැටළුව | අවිධිමත් ඉදිකිරීම් නිසා සමාජ පාරිසරික ගැටළු ඇතිවීම |
| | අරමුණු | අවිධිමත් ඉදිකිරීම් අවම කිරීම |
| | උපායමාර්ග | වසම තුල අනවසර ඉදිකිරීම් සැලසුම් සහගතව ඉදිකිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | නිවාස සංවර්ධන අධිකාරිය, දෙහිවල ගල්කිස්ස නගර සභාව තාක්ෂණ නිලධාරීන් එක්ව අවිධිමත් ඉදිකිරීම් වැලැක්වීමට කටයුතු කිරීම |
| | කාලය | අවුරුදු 1 |
| | ප්‍රතිලාභීන් | අවිධිමත් ඉදිකිරීම් නිසා පීඩාවට පත්වන ජනතාව |
| | වගකීම | නිවාස සංවර්ධන අධිකාරිය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව |
| **03.** | ගැටළුව | නාගරික බල ප්‍රදේශයන්හි දරුවන් වැඩිකොටසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම |

| | | |
|---|---|---|
| | අරමුණු | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ සංඛ්‍යාව හා භාවිතය අවම කිරීම |
| | උපායමාර්ග | මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කිරීම. |
| | ක්‍රියාකාරකම් | මත්ද්‍රව්‍ය නිවාරණය වැඩසටහන් සංවිධානය කිරීම.දේශන සංවිධානය කිරීම, අත්පත්‍රිකා බෙදා හැරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම. |
| | කාලය | අවුරුදු 1 |
| | ඍජු ප්‍රතිලාභීන් | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් |
| | වක්‍ර ප්‍රතිලාභීන් | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ පවුල්වල සමාජිකයින් |
| | වගකීම | අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ උපදේශික, සමාජ සුභසාධන නිලධාරි, ළමා සංවර්ධන නිලධාරි. |
| **04.** | ගැටළුව | ප්‍රමිතියෙන් යුත් සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම |
| | අරමුණු | විධිමත් සනීපාරක්ෂක පහසුකම් ඇතිකිරීම. |
| | උපායමාර්ග | සනීපාරක්ෂක පහසුකම් නොමැති හා අවිධිමත් ඉදිකිරීම් න්‍යාමනය කිරීම, වැසිකිලි ඉදිකිරීම් වලට නියමිත ප්‍රමිතිය ආරක්ෂා කිරීම. |
| | ක්‍රියාකාරකම් | අබලන් තත්වයේ ඇති වැසිකිලි අළුතින් ඉදිකිරීම.<br>අබලන් තත්වයේ ඇති වැසිකිලි සඳහා මුල්‍ය හා ද්‍රව්‍ය ආධාර ලබාදීම.<br>ප්‍රමිතියෙන් යුත් සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.<br>පොදු වැසිකිලි දෙක නවීකරණය කිරීම.<br>අබාධිත අය සඳහා ඔවුනට ගැලපෙන සනීපාරක්ෂ පහසුකම් වැඩිදියුණු කිරීම. |
| | කාලය | අවුරුදු 1 |
| | ඍජු ප්‍රතිලාභීන් | අලුතින් සනීපාරක්ෂ පහසුකම් හිමිවන ජනතාව |
| | වගකීම | මහජන සෞඛ්‍ය පරීක්ෂක, තාක්ෂණ නිලධාරී, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, සමාජ සේවා නිලධාරී. |

## 07.සෞඛ්‍ය හා පෝෂණය:-

| | |
|---|---|
| ගැටළුව | පාසැල් ළමුන්ගේ, පෙර පාසැල් ළමුන්ගේ, ගර්භණී මව්වරුන්ගේ සහ අඩු බර ලමුන්ගේ පෝෂණ වර්ධන සම්බන්ධ ඌනතා පැවතීම. |
| අරමුණු | බල ප්‍රදේශයේ පෝෂණ වර්ධන සම්බන්ධ ගැටළු අවම කිරීම හා සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහිකිරීම. |
| උපායමාර්ග | පවුල් සෞඛ්‍ය නිලධාරීන් සමඟ වැඩසටහන් සංවිධානය කිරීම. |
| ක්‍රියාකාරකම් | පෝෂණ වැඩසටහන් ක්රියාත්මක කිරීම.<br>අඩු බර සහිත දරුවන්ට ත්රි පෝෂ, පෝෂ්‍යදායී අහාර පිළිබඳ දැනුම ලබා දීම.<br>මාතෘ සායන සඳහා සහභාගී නොවන මව්වරුන් හා කුඩා ලමයින් ඒ සඳහා සහභාගී කරවීමට උනන්දු කරවීම. නිවැරදි හා පෝෂණ ගුණයෙන් යුතු ආහාර රටාවලට ලමයින් හුරු කරවීම. |
| කාලය | අවුරුදු 1 |
| ඍජු ප්‍රතිලාභීන් | මාතෘ සායනවලට සහභාගී වන මව්වරුන් සහ කුඩා දරුවන්. |
| වගකීම | මහජන සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය නිලධාරීන්, බටහිර සහ දේශීය වෛද්‍යවරුන්. |

## 08.විදුලිය සහ ජල පහසුකම් සංවර්ධනය කිරීම.

| | | |
|---|---|---|
| **01.** | ගැටළුව | අඩු වෝල්ටීයතාවක් සහිත විදුලි සැපයුමක් පැවතීම |
| | අරමුණු | විදුලි ධාරිතාවය ස්ථාවර කිරීම |
| | උපායමාර්ග | විදුලිය ඒකාකාරිව ලබා ගැනීමට විදුලිබල මණ්ඩලය සමග සැලැස්මක් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව වැඩි කිරීම, අධි වෝල්ටීය සම්ප්‍රේෂණ මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම. |
| | කාලය | අවුරුදු 1 |
| | ඍජු ප්‍රතිලාභීන් | ප්‍රදේශයේ ජීවත්වන ජනතාව. |
| | වක්‍ර ප්‍රතිලාභීන් | ප්‍රදේශයේ කර්මාන්තශාලාවල වැඩකරන සේවකයින් |
| | වගකීම | ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය |

| | | |
|---|---|---|
| **02.** | ගැටළුව | අඩු පීඩනයක් සහිත ජලය සෙමින් ලැබීම හේතුවෙන් කරන කාර්යයන් සඳහා වැඩි කාලයක් ගතවීම. |
| | අරමුණු | ජල පීඩනය ස්ථාවර කිරීම |
| | උපායමාර්ග | ජලය ඒකාකාරිව ලබා ගැනීමට ජල සම්පාදන මණ්ඩලය සමඟ එක්ව සැලැස්මක් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | පැරණි ජලනල ඉවත්කර අලුත් ජලනල එලීම |
| | කාලය | අවුරුදු 1 |
| | ඍජු ප්‍රතිලාභීන් | ප්‍රදේශයේ ජීවත්වන ජනතාව. |
| | වක්‍ර ප්‍රතිලාභීන් | ප්‍රදේශයේ කර්මාන්තශාලාවල වැඩකරන සේවකයින් |
| | වගකීම | ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව. |
| **03.** | ගැටළුව | අඩු පහසුකම් සහිත පාසැල්වලට දරුවන් ඇතුලත් නොවීම. |
| | අරමුණු | දැනුම හා කුසලතාවන් ඇති සමාජයක් ඇති කිරීම. |
| | උපායමාර්ග | පාසැල්වලට සම්බන්ධ පාර්ශවයන් එක්වී පාසැල් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | පාසැල් සතු භෞතික සම්පත් සංවර්ධනය කිරීම. ක්‍රීඩා පහසුකම්, විද්‍යාගාර දියුණු කිරීම |
| | කාලය | අවුරුදු 1 |
| | ඍජු ප්‍රතිලාභීන් | පාසැලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්. |
| | වගකීම | කලාප අධ්‍යාපන කාර්යාලය, අධ්‍යාපන අමාත්‍යංශය, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය. |

## 09.ක්‍රීඩා හා විනෝදාස්වාද ක්‍රියාකාරකම්

| | | |
|---|---|---|
| **01.** | ගැටළුව | පුද්ගලයින්ට ව්‍යායාම අඩුවීම හේතුවෙන් බෝ නොවන රෝගවලින් පෙලෙන ජනතාව වැඩිවීම. |
| | අරමුණු | ක්‍රීඩා කෞෂල්‍යයන් දියුණු කිරීම, කායික හා මානසික සමබරතාවයෙන් යුත් පුරවැසියන්ගෙන් සමන්විත සමාජයක් ඇතිකිරීම. |
| | උපායමාර්ග | ක්‍රීඩා අමාත්‍යංශය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ක්‍රීඩා අංශය සමඟ එක්වී වැඩසටහන් සංවිධානය කිරීම. ජාතික තරුණ සේවා සභාව සමඟ එක්වී වැඩසටහන් සංවිධානය කිරීම. තරුණ තරුණියන් ක්‍රීඩා සඳහා යොමු කිරීම. ක්‍රීඩා නිලධාරී සමඟ එක්වී වැඩ පිළිවෙලක් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | ක්‍රීඩා කෞෂල්‍යයන් ඇති අයවලුන් හඳුනා ගැනීම. ශරීර සුවතා මංතීරු ඇති කිරීම. අවම ඉඩකින් ස්ථාපිත කල හැකි ව්‍යායාම උපකරණ සවි කිරීම. අංග සම්පූර්ණ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම. ක්‍රීඩාවන් සඳහා ළමුන් යොමු කිරීම. ක්‍රීඩා උපදේශාත්මක සේවා සැපයීම. ළමා උද්‍යාන වැඩිදියුණු කිරීම. අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබාදීම. |
| | කාලය | අවුරුදු 1 |
| | සෘජු ප්‍රතිලාභීන් | ක්‍රීඩා පහසුකම් ලබන ප්‍රදේශවාසීන් |
| | වගකීම | තරුණ කටයුතු අමාත්‍යංශය. ක්‍රීඩා අමාත්‍යංශය. තරුණ සේවා සභාව. |
| **02.** | ගැටළුව | වාර්තා ගත නොවන ළමා අපයෝජනයට ලක්වන ළමුන් හඳුනා ගැනීම. ළමා අපයෝජන අවම කර ගැනීම. |
| | අරමුණු | ළමුන් ළමා හිංසනයෙන් මුදවා ගැනීම. ළමා හිංසනය මර්ධනය කිරීම. |
| | උපායමාර්ග | ළමා හා කාන්තා කටයුතු අමාත්‍යංශයේ නිලධාරින් සමඟ හා ප්‍රජා සංවර්ධන නියෝජිතයන් සමඟ සැලැස්මක් සෑදීම. ක්‍රමවත් ළමා සංවර්ධන සැලැස්මක් සැකසීම. |
| | ක්‍රියාකාරකම් | අවධානම් සහිත ළමයින් හඳුනාගෙන ළමා හා පරිවාස නිලධාරීන් වෙත යොමු කිරීම. අවධානම් සහිත ළමයින් පිළිබඳ පසු විපරම් සිදු කිරීම. පාසැල් වල දරුවන් සඳහා උපදේශන සේවා ලබාදීම. කුට්ටනයට ලක්වූ දරුවන්ට මනෝ උපදේශන සේවා ලබා දීම. |
| | කාලය | අවුරුදු 1 |
| | සෘජු ප්‍රතිලාභීන් | අවධානම් සහිත සහ කුට්ටනයට ලක්වූ දරුවන්. |
| | වගකීම | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි. |

## 10.අධ්‍යාත්මික හා සමාජ සංවර්ධනය:-

1. ග්‍රාම නිලධාරී කාර්යාලයට (කරගම්පිටිය අඹකොටුව) ඇදි සහිත ප්ලාස්ටික් පුටු 20 ලබා දීම. (වසමේ අවශ්‍යතාවයකි)
2. ශාස්ත්‍රානන්ද විහාරයේ ධර්ම ශාලා ගොඩනැගිල්ල අවසන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම.
3. කවිඩාන ශ්‍රී ශාන්තාරාම විහාරස්ථානයේ පිවිසුම් මාර්ගයේ පිවිසුම් මාර්ගය හා ඉදිරිපස කැටගල් ඇල්ලීම.
4. සුබෝධාරාම රජමහා විහාරස්ථානයේ දාන ශාලාව, ළිඳ ඇතුලු එදිනෙදා පාවිච්චියට ගන්නා බඩුබාහිරාදිය දමන ගබඩාව පිළිසකර කිරීම.

**ක්‍රීඩා පහසුකම්**

1. ශාන්තාරාම නිවාස භූමියේ ඇති කායවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ උඩු මහල සංවර්ධනය කිරීම.

## ජීවනෝපාය හා ව්‍යවසාය සංවර්ධන සැලැස්ම:-

| | |
|---|---|
| ගැටළුව | නිෂ්පාදන සඳහා වෙළඳපොල නාගරිකව අවමවීම. |
| අරමුණ | පුළුල් නිෂ්පාදන වෙළඳපොලක් සැකසීම. |
| උපායමාර්ග | තරඟකාරී නිෂ්පාදන රටාවන් වෙළඳපොලට හඳුන්වා දීම. නිෂ්පාදන සඳහා සුදුසු වෙළඳපොලක් සැකසීම. |
| **ක්‍රියාකාරකම්** | පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වා දීම. විදතා සංවර්ධන නිලධාරී සම්බන්ධ කර නිපුණතා පුහුණුව සහ තාක්ෂණික මෙවලම් හඳුන්වාදීම. ඇසුරුම්කරණය ලේබල්කරනය සම්බන්ධ දැනුම ලබාදීම. නිෂ්පාදන පිරිවැය අඩු කර විකුණුම් පිරිවැටුම වැඩි කරගත හැකි ක්‍රමඋපාය හඳුන්වා දීම. |
| කාලය | අවුරුදු 1 |
| සෘජු ප්‍රතිලාභීන් | භාණ්ඩ නිෂ්පාදකයින් හා අලෙවිකරුවන්. |
| වගකීම | විදාතා සංවර්ධන නිලධාරී. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන නිලධාරී. |

## 11.ඉතා දිළිඳු අය සඳහා වන සංවර්ධන සැලැස්ම:-

ඉතා දිළිඳු අය එම තත්වයෙන් මුදවා ගැනීම සඳහා වන සැලැස්මෙහි මූලිකවම ඔවුන්ගේ ජීවනෝපාය සවිමත් කර සුරක්ෂිත කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස අඩු වැටුප් ලබන දවස් පඩියට කුලී වැඩ කරන කම්කරුවකුට න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණුවක් ලබාදී NVQ මට්ටමේ සහතිකයක් ඇතිව ජල නල කාර්මිකයකු සේ ස්ථිර රැකියාවක් ලබාදීමෙන් ලැබෙන අදායම සථාවර වීම හේතුවෙන් බැංකු ණයක් ලබාගෙන නිවෙස අළුත්වැඩියා කර දරුවන්ට අඛණ්ඩව අධ්‍යාපනය ලබාදීමටත් ඔවුන්ට පෝෂ්‍යදායි සමබර අහාර වෙලක් ලබාදීමටත් හැකිවේ.

මීට අමතරව ඉතා දිළිඳු වීමට වඩාත්ම බලපාන අනෙක් හේතුව වන්නේ මත්පැන්, සිගරට් හෝ මත්ද්‍රව්‍යවලට හුරුවී සිටීමයි. ඔහුගේ අදායමින් වැඩි කොටස මත්ද්‍රව්‍යවලට වැයවේ. ඉතිරිවන මුදල් ප්‍රමාණය පවුලක් සුභසාධනය සඳහා ප්‍රමාණවත් නොවේ.

## 12.කාන්තා සවිබල ගැන්වීම:-

### වැන්දඹු පවුල් නගා සිටුවීම:-

| | |
|---|---|
| ගැටළුව | ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නිසා ආර්ථික ගැටළු උත්සන්න වීම. |
| අරමුණු | සැමට ප්‍රමාණවත් ආදායමක් සැලසෙන ලෙස ඔවුන්ගේ ආදායම් ඉහල නැංවීම. |
| උපායමාර්ග | නව ස්වයංරැකියා හඳුන්වා දී ඔවුන්ට ඒ සම්බන්ධයෙන් සවිබල ගැන්වීම . රාජ්‍ය නොවන ආයතන, පුද්ගලික ආයතන හා රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම. |
| ක්‍රියාකාරකම් | ස්වයංරැකියා ණය පහසුකම් සඳහා යොමු කිරීම. ස්වයංරැකියා සම්බන්ධ පුහුණුව ලබා දීම.පෞද්ගලික හා රාජ්‍ය අංශයේ රැකියාවන් සොයා දීම. ස්වයංරැකියා සම්බන්ධ පුහුණුව ලබාදීම. වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම. |
| කාලය | අවුරුදු 1 |
| ඍජු ප්‍රතිලාභීන් | අඩු ආදායම්ලාභීන් සහ ස්වයංරැකියාලාභින්. |
| වගකීම | විදාතා සංවර්ධන නිලධාරී. වනිතා සංවර්ධන නිලධාරී. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන නිලධාරී. |

## 13.පරිසර කලමණාකරන සැලැස්ම:-

### කසල කලමණාකරනය

කසල බිහිවීම අවම කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් දියත් කල යුතුයි. එකතුවන කසල තවත් නිෂ්පාදනයක අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගත හැකිය. මෙය ප්‍රතිචක්‍රීකරණය ලෙසද හැදින්වේ. මෙමගින් වාසි දෙකක් අත්වේ.

1. කසල බිහිවීම අඩුවීම
2. කසල ප්‍රයෝජනවත් අකාරයට යොදා ගැනීම මගින් ආර්ථික වාසි හිමිවීම.

පලමු පියවර වන්නේ කසල බිහිවීම අවම කිරීමයි. නැවත නැවත භාවිතයට ගත හැකි මෙවලම් හා නිෂ්පාදන හඳුන්වා දීම මගින් කසල බිහිවීම අවම කරගත හැක.

දෙවනුව කර්මාන්තශාලාවලින් බිහිවන නිෂ්පාදනද වෙනත් කර්මාන්තයක අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගැනීමෙන් එකතුවන කසල ප්‍රමාණය අඩු කරගත හැක.

පරිසරය සුරක්ෂිතව තබා ගන්නා ආකාරය පිළිබඳ සමාජය දැනුවත් කිරීම (පාරිසරික අධ්‍යාපනය) මගින්. මෙමගින් ජනතා සහභාගීත්වය ඉහල නංවා ගත හැක. ජනාවාස හා නගර පරිසර හිතකාමී ලෙස ගොඩනැංවීම මගින් පරිසරය සුරක්ෂිත කර ගත හැක.

සමුද්‍රීය සම්පත් භාවිතයට ගැනීම සිදුකල යුත්තේ කරදිය මිරිදිය මසුන්ගේ අවකාශය එනම් ජලය හැකිතාක් දුරට අපවිත්‍ර නොකරය, ජල මුලාශ්‍ර නාන ලිං වල ජලය දූෂණය නොකොට තබා ගැනීමට හැකිතාක් දුරට පියවර ගත යුතුය.

වායු ගෝලීය දූෂණය අවම කර ගැනීමට හැකිතාක් දුරට ගස් කොලන් සහිත පරිසරයක් නිර්මාණය කල යුතුය. වටිනා ශාක රැක ගැනීම, අළුතින් ගස් සිටුවීම, පාරවල් දෙපස මැද්දේ ගස් කොලං රෝපනය කිරීම හා එවා නඩත්තුව මගින් වායුගෝලය හැකිතාක් දුරට පිරිසිදුව තබා ගත හැක, මීට අමතරව වායුගෝලයට විෂ සහිත වායු මුදා හැරීම අවම කිරීම මගින් වායුගෝලය පිරිසිදුව තබා ගත හැක, උදාහරණයක් ලෙස ශිතකරණවලට සපයන ගෑස් R600 ශීතකරණ නිෂ්පාදකයන්ට සහ ගෙන්වන්නන්ට අනිවාර්යය කිරීම මගින් දූෂිත වාතය වායුගෝලයට මුදා හැරීම අඩුකරගත හැක. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මොටර් රථ භාවිතය මගින් වායුගෝල දූෂණය අවම කර ගත හැක. විදුලි බලයෙන් හා ඉන්ධන වලින් ක්‍රියා කරන දෙමුහුන් වාහන භාවිතය මගින්ද වායුගෝල දූෂණය අඩු කර ගත හැක. කර්මාණ්ත තුල ඉන්ධන භාවිතය වෙනුවට විදුලියෙන් ක්‍රියාත්මක වන උපකරණ ස්ථාපිත කිරීම මගින් දූෂණය අවම කර ගත හැක.

රටක් වශයෙන් පුනර්ජනනීය පරිසර හිතකාමී බලශක්තිවලට නැඹුරුවීමට කාලය පැමිණ ඇත, සුලං පෙති මගින්, සූර්යය කෝෂ භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය වැඩි කිරීම මගින් අනාගත බලශක්ති ඉල්ලුම සපුරාලීමට පියවර ගත යුතුයි. එවැනි පරිසර හිතකාමී බලශක්ති ප්‍රභවයන් පුද්ගලික නිවාසවලද ස්ථාපිත කිරීමට පියවර ගත යුතුයි.

කසල බැහැරකිරීමේදී පහත සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම කල යුතුව ඇත.

1. කසල වර්ගීකරණය කොට බැහැර කිරීම
2. කසල ප්‍රතිචක්‍රීකරණය
3. කසල භාවිතයට ගෙන කොම්පෝස්ට් පොහොර නිපදවීම
4. මංමාවත්, ඇලදොල, ගංගා අපවිත්‍ර වන ආකාරයෙන් කසල බැහැර නොකර විධිමත් ලෙස කසල බැහැර කිරීමට යොමුවීම.
5. මුහුදු වෙරළ තීරයට කැලි කසල දමා අපවිත්‍ර කිරීමෙන් වැලකී සිටීම හා අපවිත්‍ර වී ඇති වෙරළ තීරය ශුද්ධ පවිත්‍ර කිරීම.
6. මලප්‍රවාහන ජල නල වෙරළ තීරයේ සිට සැලකිය දුරක් දක්වා ගෙන ගොස් බැහැර කිරීම මගින් ඒවා නැවත වෙරළ තීරයට පැමිණීම වැලැක්වීම.

| | | |
|---|---|---|
| **01.** | ගැටළුව | අවිධිමත්ව කැලි කසල බැහැර කිරීම. |
| | අරමුණු | අපද්‍රව්‍ය සහ කැලි කසල කලමණාකරනය |
| | උපායමාර්ග | පරිසර හිතකාමී කැලිකසල බැහැරකිරීමේ සැලැස්මක් සකස් කිරීම. නගර සභාව සමඟ එක්ව කැලිකසල බැහැරකිරීමේ ක්‍රමවත් සැලැස්මක් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | නැවත පරිහරණය කල හැකි අපද්‍රව්‍ය මිලදී ගන්නා පුද්ගලයින් සම්බන්ධිකරණය කිරීම. කසල ප්‍රතිචක්‍රීකරණය කල හැකි උපකරණ ලබාදීම. කසල බැහැර කිරීමේ බඳුන් ප්‍රසිද්ධ ස්ථාන වල ස්ථානගත කිරීම. |
| | කාලය | අවුරුදු 1 |
| | ඍජු ප්‍රතිලාභීන් | වසමේ ජීවත්වන පවුල්. |
| | වගකීම | පරිසර නිලධාරි, මහජන සෞඛ්‍ය නිලධාරි, ප්‍රජා සංවර්ධන නිලධාරි, නගර සභාව, ප්‍රජා පොලිස් ඒකකය. |
| | ගැටළුව | ඩෙංගු උවදුර උත්සන්න වීම. |
| | අරමුණු | ඩෙංගු ව්‍යාප්තිය පාලනය කර ගැනීම. |
| | උපායමාර්ග | මහජන සෞඛ්‍ය කාර්යාලයෙන් මීට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්ධන බලකාය, මධ්‍යම රජය සහ පළාත් සභාව සමඟ එක්ව වැඩපිළිවෙලක් සකස් කිරීම. |
| | ක්‍රියාකාරකම් | අත්පත්‍රිකා, දැනුවත් කිරීමේ වැඩසටහන්, පිරිසිදු කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම . නිවාස පරික්ෂාව, පොදු ස්ථාන පිරිසිදු කිරීම. දුම්මායනය කිරීම, කාණු පිරිසිදු කිරීම. |

| | | |
|---|---|---|
| | කාලය | අවුරුදු 1 |
| | ප්‍රතිලාභීන් | වසමේ ජීවත්වන පවුල්. |
| | වගකීම | පරිසර නිලධාරි, මහජන සෞඛ්‍ය නිලධාරි, |
| | ගැටළුව | වර්ෂා කාලයේදී ප්‍රදේශ ජලයෙන් යටවීම. |
| | අරමුණු | නිවාස දේපලවලට සිදුවන හානි අවම කර ගැනීම. |
| | උපායමාර්ග | වැසි ජලය නිසි පරිදි බැස යන ක්‍රමවේදයක් සැකසීම. ජලය බැසයන කාණු මත ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම |
| | ක්‍රියාකාරකම් | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීම. කාණු ශුද්ධ පවිත්‍ර කිරීම. අබලන් වී ඇති කාණු සංවර්ධනය කිරීම. |
| | කාලය | අවුරුදු 1 |
| | ප්‍රතිලාභීන් | වසමේ ජීවත්වන පවුල්. |
| | වගකීම | පරිසර නිලධාරි, ආපදා කලමණාකරන නිලධාරි, නගර සභාව, සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරි. |

## 15.කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම

දෙහිවල ප්‍රදේශයේ වර්ග කිලෝමීටර 9 ක පමණ එක් ලක්ෂ අසූදාහක පමණ ජනතාවක් ජීවත් වෙයි. එබැවින් එය සතු ඉඩකඩ ඉතා සීමිත වේ. විශාල හිස් ඉඩම් අතලොස්සක් දක්නට ලැබුණද බහුතර ඉඩම් වල ඇති ඉඩ ප්‍රමාණය බෙහෙවින් සීමිතය. මෙම සීමිත ඉඩ ප්‍රමාණය තුලද රථවාහන කිහිපයක් ගාල් කර තබා ගත යුතු බැවින් එම සීමිත ඉඩෙන්ද ප්‍රයෝජනයට ගත හැකි ඉඩ තවදුරටත් සීමා වේ. මේ හේතු නිසා කෘෂි බෝග විශාල වශයෙන් වගා කිරීම අපහසු කරුණකි. නවීන ක්‍රමවේද භාවිතයට ගනිමින් මහල් නිවාසවල ගෙයි කොන්ක්‍රීට් ස්ලැබ් එක උඩ හා උඩමහල්වල කොරිඩෝවල සිරස් අතට එදිනෙදා භාවිතයට ගත හැකි බෝග වගා කල හැකිය. එළවලු, මිරිස් පැල, විශාල ලෙස නොවැඩෙන ගස් වගා කල හැක. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිටුවන බීජ සහ පැල බෙදා දීම සිදුකල හැකිය. මීට අමතරව කුඩා පැල තවාන් දමා වගා කිරීමට උනන්දුවක් දක්වන ප්‍රජාව වෙත බෙදා දීමට පුළුවන. මීට අමතරව වගා දැනුම ලබා දීම ඉතා වැදගත්ය. නවීන වගා ක්‍රම, පලදාවයෙන් වැඩි බීජ, වගා නඩත්තුව ගැන උපදෙස්, වැඩි අස්වැන්නක් ලබා ගත හැකි පැල සහ වගා ක්‍රම, වගාවන් සඳහා කාබනික පොහොර භාවිතය ගැන උපදෙස්. කාබනික පොහොර සපයා ගත හැකි අකාර. රසායන පොහොර හා ඒ පිළිබඳ උපදෙස්. වගාවලට වැළඳෙන රෝග හා එවා නිවාරණය කර ගන්නා ආකාරය. පැල බද්ධ කිරීම (Grafting), බොන්සායි ක්‍රමය, ක්ලෝන තාක්ෂණය භාවිතය වැනි නවීන ක්‍රම මගින් සපයා ගත් පැල සහ වගා ක්‍රම හඳුන්වා දිය හැක. වගාකිරීමට හැකි සෑම නිවෙසකටම පොල් පැලය බැගින් ලබාදීම සිදුකල හැකිය. මේ මගින් දැනට පවතින පොල් නිෂ්පාදනයට දායක වී

පොල් හිගයට තාවකාලික හෝ විසඳුමක් ලබාදිය හැකිය. හැකි සෑම ගෙදරකම තමුන්ට අවශ්‍ය පලා වර්ග තම ගෙවත්තෙන්ම වගා කර ගැනීමට ප්‍රජාව හුරු කල හැකිය. මීට අමතරව විදේශ රටවල මෙන් (herbs) බේ කොල, රෝස්මරි, මින්ච්, කොත්තමල්ලි, පාස්ලි කොල තම නිවසේම වගා කර සපයා ගැනීම මගින් නැවුම්බවින් යුත් ආහාර පිළියෙල කර ගත හැක.

| | |
|---|---|
| ගැටළුව | ගෙවතු වගාව සඳහා බිජ වර්ග නොමැති වීම. ගෙවතු වගාව ගැන ජනතාවගේ දැනුම අවම විම. වගාව සඳහා ඇති ඉඩකඩ අවම වීම. |
| අරමුණු | නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම. |
| උපායමාර්ග | අවම ඉඩකින් වැඩි ඵලධායිතාවක් සහිත වගා ක්‍රම සහ බීජ වර්ග ප්‍රජාවට හඳුන්වා දීම. වගා දැනුම ඇති කෘෂි නිලධාරීන් සහ ආයතන සම්බන්ධිකරණය කිරීම. |
| ක්‍රියාකාරකම් | වැඩි ඵලදායිතාවක් සහිත බීජ සහ පැල හඳුන්වා දීම. කෘෂි ප්රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, තිරස් වගාව ප්රජාවට හඳුන්වා දීම. වගාවන්ට වැලදෙන රෝග නිවාරණ උපක්රම, පොහොර භාවිතය සම්බන්ධ උපදෙස් ලබාදීම. වගා නඩත්තු ක්රම හඳුන්වා දීම. |
| කාලය | අවුරුදු 1 |
| ප්‍රතිලාභීන් | වසමේ වගාවන්ට සම්බන්ධවන පවුල්. |
| වගකීම | කෘෂි නිෂ්පාදන සහ පර්යේෂණ නිලධාරි. කෘෂිකර්ම නිලධාරි. ගොවිජන සේවා නිලධාරි |